# ලාංකේය පුරාවිද්‍යාව අභිමුඛව ඇති අභියෝග

බී.පී.එස්.එම්. කුමාරි

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය.
sewwandimadushika641@gmail.com

**මුඛ්‍ය පද** - විෂය පථය, පුළුල්, රාමුව, තාක්ෂණය

## හැඳින්වීම

පුරාවිද්‍යාව යනු කුමක්දැයි පිළිබඳ ව පිළිගත් නිර්වචනයක් ඇසුරින් යම් අදහසක් මෙසේ ලබා ගත හැකි ය. එනම් The Oxford English Reference Dictionary අනුව පුරාවිද්‍යාව යනු ''භෞතික අවශේෂ විශ්ලේෂණය කිරීම හා ක්ෂේත්‍ර කැණීම් මගින් මානව ඉතිහාසය හා ප්‍රාග් ඉතිහාසය පිළිබඳ අධ්‍යයනය කිරීමක්'' යන්නයි. පුරාවිද්‍යා විෂය පථය ඉතාමත් පුළුල් වපසරියක විහිදී ඇති විෂය පථයක් වන අතර මෙහි ඇති සුවිශේෂීත්වය නම් එක් නිශ්චිත රාමුවකට යට නොවී පුළුල් විෂය පරාසයන් රැසකට ව්‍යාප්තව පැවතීමයි. එම ප්‍රමුඛ ලක්ෂණය කරණව රාමුවෙන් පරිබාහිර විවිධ විෂය පථයන් මගින් පුරාවිද්‍යා විෂය නිරවද්‍ය ලෙසින් ගවේෂණයට, අධ්‍යයනයට වැඩි පහසුවක් ලැබේ. මෙහි දී පෙන්වා දිය යුතු ප්‍රබලතම අරමුණ නම් ඇතැම් විට පුරාවිද්‍යා විෂය තුළ යම් සාම්ප්‍රදායික රාමුවක් යටතේ ගෝලීය මට්ටමට සාපේක්ෂව ලාංකේය ජනයා විසින් අවම තියුණු උපකරණ භාවිතයේ ඌනතාව මැඩලීම පෙන්වා දිය හැකි ය. අනෙකුත් විෂය ක්ෂේත්‍රයන් මෙන් ගණිත කර්ම, සූත්‍රයන්ට, න්‍යායන්ට ලඝු වූ විෂය පථයක් නොව පුද්ගල පරිකල්පන, මනෝභාවයන් ද අඩු වැඩි වශයෙන් මෙම විෂයට ඍජුව ම ඉවහල් වන විෂය ක්ෂේත්‍රයකි. බහුවිෂයික හා අන්තර් විෂයික සබඳතා ඇති පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රයේ අන්තර් ජාතික මට්ටමට සාපේක්ෂව ලාංකේය පුරාවිද්‍යාවේ තියුණු තාක්ෂණික උපාංග භාවිතයේ යම් මන්දගාමී ස්වරූපයක් උසුලුණු ඇත. එම ගැටලුකාරී තත්ත්වයන් අභියෝග නිසි අයුරින් වටහා ගෙන ආදි ඉතිහාසය වැළලී යාමට ඉඩ නොදී ඒ ඒ ඓතිහාසිකමය තොරතුරු අධ්‍යයනය කළ යුතුය.

## ක්‍රමවේදය

පූර්ව පර්යේෂණ අධ්‍යයන පිළිබඳ තොරතුරු ලබා ගැනීමට සාහිත්‍ය මූලාශ්‍ර අධ්‍යයනය, අන්තර්ජාලය, Google Scholar, විවිධ වෙබ් අඩවි අධ්‍යයනය කිරීම තුළින් තොරතුරු සමස්තයක් ලෙස එක් කොට විශ්ලේෂණය කර පර්යේෂණ පත්‍රිකාව ඉදිරිපත් කෙරේ.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

මේ වන තෙක් සහ පැවති වාතාවරණය අනුව ලංකාව සංවර්ධනය වෙමින් පවතින රටකි. ලෝකයේ දිනෙන් දින වර්ධනය වන තාක්ෂණයට කළ නොහැක්කක් ඇත් ද යන්න ප්‍රහෙළිකාවකි. පුද්ගල මනස තරම් ප්‍රබල ඉන්ද්‍රියක් තවත් නැත. එසේ වුවද මිනිස් මොළය සහ පරිගණකය එකක් සේ සලකා ක්‍රියා කර ගත හැකි අයුරින් මිනිසාගේ සිතුවිලි තුළින් පමණක් සියලු ම ක්‍රියාවෝ මෙහෙයවීමටත් අවැසි Neura link නම් තාක්ෂණික ක්‍රමවේදයන් 'ඉලොන් මස්ක්' විසින් මනස මූලිකව දැනටමත් සොයා ගෙන ඇත. ඒ තුළින් සුබවාදී සේම අසුබවාදී පැතිකඩයන් රැසක් පවතී. නමුත් අප මෙහි දී සිතිය යුත්තේ එය නොව ඒ සූක්ෂම තාක්ෂණය පිළිබඳවයි. සිතුවිලි තුළින් සමස්ත ලෝකයක් පාලනය කිරීමට හැකි වීමට නම් කෙබඳු තාක්ෂණයක් තිබිය යුතු ද? මෙහි දී කාලීන වශයෙන් වුව සමාජයක් වශයෙන් වුව පුරාවිද්‍යා විෂයට අවැසි තාක්ෂණ උපාංගයෝ භාවිතයේ වැදගත්කම් රැසකි. ඒ තාක්ෂණයේ වැදගත්කම් යම් ප්‍රමාණයක් භුක්ති වින්ද ද ගෝලීය මට්ටමට සාපේක්ෂව යම් මන්දගාමී ස්වරූපයක් උසුලනු ඇතැයි කිව හැකි ය. එබැවින් පුරාවිද්‍යා විෂය අභාවයට යාමට ඉඩ නොදිය යුතු ය.

එම අභියෝග ජය ගැනීමට නැතහොත් එහි ප්‍රතිඵල ලබා ගැනීමට අපට ඇති ප්‍රධානතම විකල්පය අප විසින් භාවිත සම්ප්‍රදායික තාක්ෂණික උපාංග ද භාවිත කොට ඒ සමඟ ම නවීන තියුණු තාක්ෂණික උපකරණයන් භාවිත කිරීමයි. මනස වැනි සියුම් ඉන්ද්‍රියක් ඉතා කුඩා තාක්ෂණික උපාංගයක් මඟින් කියවීමට හැකි නම් මෙවැනි බහුවිධ විෂය පථයකට උරුමකම් කියන පුරාවිද්‍යා විෂය තුළට තියුණු තාක්ෂණික උපකරණ භාවිත කළ නොහැකි ද එසේම රටෙහි පවතින දැඩි තරගකාරී අධ්‍යාපන රටාවකට මුහුණ දෙන වත්මන් සමාජ කණ්ඩායම් පුරාවිද්‍යා විෂය අධ්‍යයනයට යම් නොපසුබට බවක් දක්වති. මේ සඳහා හේතුවක් ලෙසින් පෙර කී යල්පැන ගිය තාක්ෂණය භාවිත කිරීමක් ඒ තුළින් ඇති වන්නා වූ දුෂ්කරතා ජය ගැනීමේ අපහසුතාවත් තරමක් පවතින නිසාවෙන් ගතානුගතික තාක්ෂණයෙන් මිදී ගෝලීය මට්ටමෙන් භාවිත තාක්ෂණය තියුණු කිරීමක් සිදු කළ යුතුය. පුරාවිද්‍යාව වැනි විෂය පථයක් අධ්‍යයනය කිරීමෙන්, ප්‍රගුණ කිරීමෙන් අධ්‍යාපනික මට්ටම්, වෘත්තිමය මට්ටම් ලැබෙන්නා වූ වෘත්තිමය වටිනාකමට සරිලන අවම වැටුප තුළින් වේවා සමස්තයක් දෙස ලැබී ඇති වටිනාකමෙහි සමාජ, ආර්ථික ඌනතාවය මැඩලිය යුතුය. ඉන් පුරාවිද්‍යා විෂය කිසිම විටෙක යල් පැනගිය, සාම්ප්‍රදායික විෂය පථයක් ලෙස නොසලකා සහ ඉන් ඉගැනිය හැකි අත්දැකීම් ප්‍රමාණය කිසිම විටෙක ප්‍රමාණගත කර ගත නොහැක. එහි වටිනාකම අවබෝධ කර ගත යුතුය. ලාංකිකයෙකු වී ඉපිද අමරණීය ආදි ඉතිහාසයකට උරුමකම් කියන අප හෙළ සමාජයේ කිසිවක් කිසිවෙක් ගවේෂණය නොකොට මුදල් පමණක් උපයා මිය යාම තරම් අසාධාරණයක් තවත් ලොව නැත. ඒ අපේ මුතුන් මිත්තන්ගේ නහරවැල් තුළ කිඳා බැස ඇති දහදිය මහන්සියේ ප්‍රතිඵලයි. එම ගැටලුකාරී තත්ත්වයන් මඟහැර ගැනීමට නම් නව දැනුම, අදහස්, ආකල්ප ඇති ඒ ඒ ප්‍රජාව හඳුනාගෙන ඔවුන්ගේ හැකියා වර්ධනය කිරීමට අවශ්‍ය ලෙස සන්දර්භය සකසා දිය යුතුය. බොහෝ ශිෂ්‍ය ශිෂ්‍යාවන් සතුව එවැනි ආකල්ප පැවතිය ද ඒවා පවත්වා ගෙන යාමට ඔප නැංවීමට අවශ්‍ය පරිසරයක්, අදාල අධ්‍යාපන පසුබිමක් හෝ සමාජ වටපිටාවක් ඔවුන්ට ගොඩනගා දිය යුතුය. උගත් යැයි සම්මත බොහෝ පිරිස් විසින් බොහෝ මිල මුදල් වියදම් කොට පාසල් වේවා විශ්වවිද්‍යාල මට්ටමින් වේවා යම් යම් සැණකෙළි කටයුතු සඳහා මුදල් වියදම් කොට ඒ ඒ ඉලක්ක ගත පිරිස උදෙසා යම් කෙටි කාලීන ආස්වාදයක් ලබා දුන් වුව පෙර කී පරිදි නව අදහස්, ආකල්ප ඇති ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ ඒ ඒ හැකියා වර්ධනයට අවැසි උපාංග නිර්මාණයට අවශ්‍ය ආර්ථිකමය සවිමත්බවට යම් ශක්තියක් වූවා නම් මේ වන විටත් අවම කාලයක් තුළින් ඵලදායී නිර්මාණශීලී නව අත්හදා බැලීම් සාර්ථක ලෙස ලාංකේය මට්ටමින් හා ගෝලීය මට්ටමින් පිළිබිඹු කිරීමට හැකියාව ලැබේ.

ලාංකේය පුරාවිද්‍යාව යම් තරමක් සාම්ප්‍රදායික ස්වරූපයක් උසුලයි. පුරාවිද්‍යා තාක්ෂණික පැතිකඩ බොහෝ සෙයින් දියුණු කිරීමටත් අපගේ ආදි ඉතිහාසය වැලළීයාමටත් ඉඩ නොදී ඒවා සුරක්ෂිත කිරීමටත් අධ්‍යයනය කිරීමටත් ඒ ඒ සමාජ, ආර්ථික, ආගමික, සංස්කෘතික ආදි යහපත් සන්දර්භයන් තත්කාලීන සමාජයයේ පැවැත්ම උදෙසා අඩු වැඩි වශයෙන් උපයුක්ත කර ගත හැකි ය. එසේම පුරාවිද්‍යා විෂය ක්ෂේත්‍රයට සමාජීය වශයෙන් සේම ආර්ථික වශයෙන් ද දැනට සාපේක්ෂව වර්ධිත වටිනාකමක් ලබා දුන්හොත් බොහෝ හැකියා කුසලතා ඇති ප්‍රජාව මේ සඳහා ඇදී එති. එයින් නව දෘෂ්ටියකට පුරාවිද්‍යා විෂය ඇදී යති. ඒ තුළින් ලැබිය හැකි සමාජීය වර්ධනයන් බොහෝ ය.

**ආශ්‍රිත මූලාශ්‍රය**

බස්නායක, එච්. වී., සහ හෙට්ටිගේ, යු., (2008) ***පුරාවිද්‍යා ප්‍රවේශය,*** කොළඹ: එස් ගොඩගේ සහ සහෝදරයෝ.

ගුණවර්ධන, පී., (2008), ***පුරාවිද්‍යා හැඳින්වීම හා මූලික සංකල්ප***, ජා ඇල: සමන්ති පොත් ප්‍රකාශකයෝ.

වත්තල, එස්., (2016) ***පුරාවිද්‍යාව හැදෑරීම***, කොළඹ: ඇස්. ගොඩගේ සහ සහෝදරයෝ (පුද්) සමාගම.